# ඡන්ද කටයුතු නිරීක්ෂණයට පැෆරල් සංවිධානයට අවසර

ජේ. ටී. ද සිල්වා, දයා පෙරේරා

ජනාධිපතිවරණයේ ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල නිකුත් කරන මධ්‍යස්ථානවල කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පැෆරල් සංවිධානයට මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය ලැබී ඇතැයි එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

ඡන්ද මධ්‍යස්ථාන 12,000ක නිරීක්ෂණ කටයුතුවලට අතිරේකව ඡන්ද ගණන් කරන ස්ථානවල නිරීක්ෂණ කටයුතු පිණිස විශේෂ නිරීක්ෂකයන් පිරිසක් තෝරාගෙන ඇති බවත් පැවැසූ ඒ මහතා ඉදිරි දිනවලදී ඔවුන් විධිමත් ලෙස පුහුණු කරන බවත් කීවේය.

ඡන්ද ගණන් කරන මධ්‍යස්ථාන සංඛ්‍යාව 1,250කි. මේ ස්ථානවල නිරීක්ෂණ රාජකාරි සඳහා නිරීක්ෂකයන් 109 දෙනකු යෙදවීමට කටයුතු කරන බව පැෆරල් සංවිධානයේ ජාතික සම්බන්ධීකාරක සුජීව ගයනාත් මහතා පැවැසීය.

ඡන්ද මධ්‍යස්ථානවල නිරීක්ෂණ කටයුතු සඳහා දේශීය නිරීක්ෂකයන්ට අවස්ථාව ලැබුණත් ගණන් කරන හා ප්‍රතිඵල නිකුත් කිරීමේ මධ්‍යස්ථානවලට මැතිවරණ නිරීක්ෂකයන් යෙදවීමට අවසර ලැබුණේ මැතිවරණ ඉතිහාසයේ පළමු වරට බවද හෙට්ටිආරච්චි මහතා කීය.